# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.05 පැය 0845 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out /651/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. හෙරොයින් හා ජීව අත්බෝම්බයක් සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්දන ඒකකය.**

2025.04.04 වන දින රාත්‍රී කාලයේ කඩවත පොලිස් වසමේ සූරියපාළුව ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්දන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 18 ක් හා ජංගම දුරකථන 02 ක් සමඟ සැකකරුවෙකු, හෙරොයින් ග්‍රෑම් 19 මිලි ග්‍රෑම් 210 ක්, විදේශ රටක නිෂ්පාදිත ජීව අත් බෝම්බයක් හා ජංගම දුරකථන 02 ක් සමඟ සැකකරුවෙකු සහ හෙරොයින් ග්‍රෑම් 14 මිලි ග්‍රෑම් 850 ක් හා ජංගම දුරකථන 02 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට කඩවත පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 24 හා 33 අතර වයස්වල පසුවන කළුගල නින්දන හා බටපොල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

කඩවත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් අංශය.**

2025.04.04 වන දින රාත්‍රී කාලයේ කටාන පොලිස් වසමේ කිඹුලපිටිය ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර හෙරොයින් ග්‍රෑම් 104 ක්, ජංගම දුරකථන 04 හා යතුරුපැදියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කටාන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 වන කදිරාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කටාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**03. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුර.**

2025.04.04 වන දින සවස් කාලයේ නාවුල පොලිස් වසමේ උස්සැත්තාව ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල්ල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර නීති විරෝධී මත්පැන් ලීටර් 33 ක්, තඹ දඟරයක් හා යකඩ බැරල් එකක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන නාඋල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන අලුත්ගම, මනන්වත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නාඋල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කර ගෙන යනු ලබයි.

## 04. ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කායර් බලකා ත්‍රිකුණාමලය කඳවුර.

2025.04.04 වන දින සවස් කාලයේ චීනවරාය පොලිස් වසමේ කොඩ්බේ ධීවර වරාය අසලදී පොලිස් විශේෂ කායර් බලකා ත්‍රිකුණාමලය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර ගංජා ග්‍රෑම් 500 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන චීනවරාය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 20 ක් වන ත්‍රිකුණාමලය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

චීන වරාය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කර ගෙන යනු ලබයි.

## 05. තීරුබදු නොගෙවා මෙරටට ගෙන්වන ලද දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කායර් බලකා හොරණ කඳවුර.

2025.04.04 වන දින දහවල් කාලයේ හොරණ පොලිස් වසමේ බටුවිට හංදිය අසලදී පොලිස් විශේෂ කායර් බලකා හොරණ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර තීරුබදු නොගෙවා මෙරටට ගෙන්වන ලද දුම්වැටි 240 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන හොරණ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 73 ක් වන ගෝනපල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හොරණ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කර ගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**